## අඟහරුවාදා

පළමුවන කියැවීම දානියෙල් 2: 31–45

දානියෙල් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"ස්වර්ගයේ දෙවියන් වහන්සේ කිසිකලෙක නැති නොවන රාජ්‍යයක් පිහිටුවන සේක."**

නෙබුකද්නෙසර් රජුගේ ස්වප්නය තේරුම් කර දෙමින් දානියෙල් මෙසේ පැවසීය. "දේවයන් වහන්ස, ඔබ අති විශාල රූපයක් දුටුවෙහි ය. ඒ විශාල දීප්තිමත් රූපය ඔබ ඉදිරියෙහි තිබුණේ ය. එහි පෙනීම භයංකර ය. ඒ රූපයේ හිස දඹ රනින් ද ළය සහ අත් රිදියෙන් ද බඩ සහ කලවා ලෝකඩවලින් ද පාදවල කොටසක් යකඩෙන් ද කොටසක් මැටියෙන් ද කරන ලදි. ඔබ බලා සිටිය දී මිනිස් අතින් නොකපන ගලක් කන්දෙන් ගැලවී අවුත් රූපයේ යකඩ සහ මැටි පාදවල වැදී ඒවා පොඩිකර දැමී ය. එවිට යකඩ ද මැටි ද ලෝකඩ ද රිදී ද රත්තරන් ද එකට පොඩි වී ගිම්හාන කාලයේ කමතේ බොල් මෙන් සුළඟට ගසා ගෙන ගියේ ය. ඒවායේ ශේෂ මාත්‍රයක් වත් ඉතුරු නොවී ය. රූපයට වැදුණු ගල විශාල පර්වතයක් විය. එයින් පොළොව පිරී ගියේ ය. "එය ය, ඔබ දුටු ස්වප්න ය. දැන් එහි තේරුම රජ්ජුරුවන්ට මම කියා දෙන්නෙමි. රාජාධිරාජ දේවයන් වහන්ස, ස්වර්ගයේ දෙවියන් වහන්සේ ඔබට රාජ්‍යය ද බලය ද පරාක්‍රමය ද තේජස ද දී තිබේ. සැම තැන ම වසන මිනිසුන් ද මෘගයන් ද ආකාශ පක්ෂීන් ද ඔබ අතට භාර දී ඔවුහු සියල්ලෝ ඔබේ පාලනයට යටත් කරන ලදහ. රත්රන් හිස නම් ඔබ ය. ඔබට පසු ඔබේ රාජ්‍යයට වඩා පහත් රාජ්‍යයක් ද ඉන්පසු ලෝකඩවලින් අදහස් කෙරෙන ලොව පුරා පාලනය පැතිර පවත්නා තුන් වන රාජ්‍යයක් ද නැඟී එන්නේ ය. යකඩ මෙන් සවි ශක්තිය ඇති රාජ්‍යයක් සතර වන වර ඇති වන්නේ ය. යකඩ සියල්ල කඩා බිඳ සුණු විසුණු කරන්නාක් මෙන් ඒ රාජ්‍යය අන් සියල්ල කඩා බිඳ සුණුවිසුණු කරන්නේ ය.

ඔබ දුටු පාද හා පා ඇඟිලිවලින් දැක්වෙන්නේ කොටසක් කුම්භකාරයාගේ මැටියෙන් ද කොටසක් යකඩෙන් ද යුක්ත ව ඒ රාජ්‍යය බෙදී යන බව ය. එහෙත්, යකඩ මැටි හා මිශ්‍රව තිබෙනු ඔබ දුටු පරිදි ඒ රාජ්‍යයේ අයෝමය ශක්තියත් තරමක් දුරට පවතින්නේ ය. පා ඇඟිලිවලින් කොටසක් යකඩෙන් ද එක් කොටසක් මැටියෙන් ද තිබුණාක් මෙන් ඒ රාජ්‍යයෙන් කොටසක් ශක්තිමත් වන්නේ ය. කොටසක් බිඳෙන සුලු වන්නේ ය. යකඩ මැටි මිශ්‍රව තිබෙන ඔබ දුටු ලෙස මනුෂ්‍යයෝ විවාහයෙන් මිශ්‍ර වන්නෝ ය. එහෙත් යකඩ හා මැටි මිශ්‍ර නොවන සේ ඔවුහු එකට බැඳී නොසිටිති. ඒ රජ්ජුරුන්ගේ කාලවලදී ස්වර්ගයේ දෙවියන් වහන්සේ කිසි කලෙක නැති නොවන රාජ්‍යයක් පිහිටුවන සේක. ඒ රාජ්‍යය අන් ජාතියකට යටත් නොවන්නේ ය. එය සියලු රාජ්‍යයන් සුණු විසුණු කරදමනු ඇත. එය ද සදාකාලයට ම පවතින්නේ ය. අතින් නොකැපූ ගලක් කන්දෙන් ගැලවී අවුත් යකඩ ද ලෝකඩ ද මැටි ද රිදී ද රත්රන් ද පොඩි කර දමනු ඔබ දුටු ලෙස එය ඒ සියලු රාජ්‍යයන් පොඩි කර නැති කරන්නේ ය. ඔබ දුටු දර්ශනයේ තේරුම එය වේ. මහෝත්තම දෙවියන් වහන්සේ මතු සිද්ධ වන්නට යන දේ රජුට දන්වා තිබේ. ස්වප්නය සැබෑ ය. එහි තේරුම නොඅනුමානය."

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය දානියෙල් 1: 35–39

**පිළිතුර : සදා ස්තුතියත් මහිමයත් සමිඳුන් හට වේවා.**

ගීය :

සමිඳුන් මැවූ සියල්ලෙනි, සමිඳුන් හට පසසන්න.
මහිමයත් සදා ස්තුතියත් එතුමන් හට පුදන්න.
සමිඳුන්ගේ සුරදූතයෙනි, ඔබ සියලු දෙන සමිඳුන් පසසන්න.
මහිමයත් සදා ස්තුතියත් එතුමන් හට පුදන්න.

අහස්තලයෙනි, සමිඳුන් පසසන්න. මහිමයත් සදා ස්තුතියත් එතුමන් හට පුදන්න.
අහසට ඉහළින් ඇති ජලාශයෙනි, සමිඳුන් පසසන්න.
මහිමයත් සදා ස්තුතියත් එතුමන් හට පුදන්න.

සමිඳුන්ගේ බලනාවයෙනි, ඔබ සියලු දෙන සමිඳුන් පසසන්න.
මහිමයත් සදා ස්තුතියත් එතුමන් හට පුදන්න.

සුපුවත් ජය නද ලුක් 21: 28

ආලේලූයා! ආලේලූයා!
“ඔබේ විමුක්තිය ළංවේගෙන එන බැවින්
නැගී සිට හිස ඔසවන්නැ යි
සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

නොහොත්

සුපුවත් ජය නද එළිදරව්ව 2: 10

ආලේලූයා! ආලේලූයා!
“මරණය දක්වා විශ්වාසී ව සිටින්න.
එවිට මම ඔබට ජීවන කිරුළ ප්‍රදානය කරමි” යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

සුවිශේෂය ලුක් 21: 5-11

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**“ගලක් පිට ගලක් ඉතිරි නොවන සේ බිඳ දමනු ලබන කාලයක් පැමිණෙන්නේ ය.”**

සමහරුන් දේව මාලිගාව ගැන කතා කරමින්, එය මනහර ගලින් හා පූජා වස්තුවලින් ද සරසා තිබෙන නියාව පැවසූ විට ජේසුස් වහන්සේ කතා කොට, “ඔබට පෙනෙන මේ දෙය, ගලක් පිට ගලක් ඉතිරි නොවන සේ බිඳ දමනු ලබන කාලයක් පැමිණෙන්නේය” යි වදාළ සේක.

“ගුරු දේවයෙනි, ඒ දෙය කවර කලෙක වන්නේ ද? ඒ පිළිබඳ පෙර ලකුණු කවරේ දැ” යි ඔවුහු උන්වහන්සේගෙන් ඇසූහ. උන්වහන්සේ කතා කොට, “මුළා නොවන්නට බලා ගන්න. කුමක් නිසා ද මාගේ නාමයෙන් බොහෝ දෙනෙක් ඉදිරිපත් වී ‘ඒ මම ය, නියමිත මොහොත පැමිණ ඇතැ’ යි කියන්නෝ ය. ඔවුන් අනුව නොයන්න. යුද්ධ සහ විප්ලව ගැන ආරංචි වන විට, භයින් ත්‍රස්ත නොවන්න. මන්ද, මේ දේවල් පළමුකොට සිදු විය යුතු ය: එහෙත් අවසානය එකෙණෙහි ම නොපැමිණෙන්නේ ය” යි වදාළ සේක.

එවිට උන්වහන්සේ ඔවුන්ට කතා කොට, “ජාතියක් ජාතියකට විරුද්ධ ව ද රාජ්‍යයක් රාජ්‍යයකට විරුද්ධ ව ද නැගිටිනු ඇත. මහා භූමි කම්පා ද නොයෙක් තැන්වල සාගත හා වසංගත ද වන්නේ ය. ත්‍රාසජනක දර්ශනය ද පුදුම ලකුණු ද අහසෙහි වන්නේ ය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.